

# ළමා අයිතිවාසිකම්

එක්සත් ජාතීන්ගේ ළමා අයිතීන් පිළිබඳ ප්‍රඥප්තිය යනු සියලුම ළමුන් හට ඇති අයිතිවාසිකම් පිළිබඳ සඳහන්ව ඇති ජාත්‍යන්තරව පිළිගත් ලියවිල්ලකි. ශ්‍රී ලංකාව ද ඇතුළුව ලොව සෑම රටක් ම පාහේ මෙය පිළිගෙන ඇති අතර, ළමුන් හට සැලකීමේ දී මෙම ලියවිල්ල පාදක කරගත යුතු බව එහි සඳහන් වේ.

ළමා අයිතිය පිළිබඳ ප්‍රඥප්තියට අත්සන් කර ඇත්තේ රජයයන් වුව ද ළමුන් තම අයිතීන් පිළිබඳව දැන සිටීම ඉතා වැදගත් ය.

මෙහි සඳහන්ව ඇත්තේ ළමා අයිතීන් පිළිබඳ ප්‍රඥප්තියේ සරල අනුවාදයකි. මේ ඔබේ අයිතිවාසිකම් ය.

### 1. ළමයා පිළිබඳ නිර්වචනය
අවුරුදු 18 න් පහළ සෑම කෙනෙකුම ළමයකු ලෙස සැළකේ. ඔවුන් හට මෙම ප්‍රඥප්තියේ සඳහන් සියලුම අයිතිවාසිකම් හිමි විය යුතු ය.

### 2. වෙනසක් නොකිරීම
ළමුන් කවුරුන් වුව ද කුමන වයසක වුව ද කිසියම් ආබාධයක් සහිත වුව ද කුමන වර්ණයකින් යුක්ත වුව ද කුමන ජාතියකට හෝ ආගමකට අයත් වුව ද කුමන භාෂාවක් කතා කළ ද, ඒ සැමටම මේ අයිතිවාසිකම් හිමි ය. සෑම ළමයකු හටම වෙනස්කම් නොකිරීමට රජය වග බලා ගත යුතු අතර, ළමා අයිතීන් ප්‍රචලිත කිරීම ද රජයේ වගකීම යි.

### 3. ළමයාගේ උපරිම යහපත
ළමුන් හා සම්බන්ධව ක්‍රියාකරන විට දී සහ ඔවුන් පිළිබඳව ගන්නා තීරණවල දී ළමයාගේ උපරිම යහපත සලකා ක්‍රියා කළ යුතු ය.

### 4. ප්‍රඥප්තිය ක්‍රියාත්මක කිරීම
ප්‍රඥප්තියට ඇතුළත් කර ඇති සියලු ම අයිතිවාසිකම් ක්‍රියාත්මක කිරීමට රජය විසින් හැකි සෑම දෙයක්ම කළ යුතු ය.




### 5. දෙමව්පිය මාර්ගෝපදේශකත්වය හා ළමයාගේ වර්ධනය
ළමයාට අවශ්‍ය මාර්ගෝපදේශකත්වය සැලසීමෙහිලා පවුල සතු වගකීමට ද දෙමව්පිය අයිතීන් හා වගකීම්වලට ද රජය ගරු කළ යුතු ය.

### 6. පැවැත්ම සහ සංවර්ධනය
ජීවත් වීමට අයිතියක් ළමුන් සතු බව සියලු දෙනා ම පිළිගත යුතු ය. ළමයාගේ පැවැත්ම හා සංවර්ධනය සුරක්ෂිත කිරීම රජයේ වගකීම වේ.

### 7. නම සහ ජාතිකත්වය
ඉපදුන ද සිට නමක් හා ජාතිකත්වයක් ලැබීමට සෑම ළමයකුටම අයිතියක් ඇත. ඔහුගේ/ඇයගේ දෙමව්පියන් කවුරුන් දැයි දැන ගැනීමටත් ඔවුන්ගේ ආදරය ලැබීමටත් ළමයාට අයිතියක් ඇත.

### 8. අනන්‍යතාවය ආරක්ෂා කිරීම
ළමයාගේ අනන්‍යතාවය ආරක්ෂා කිරීමට රජය බැඳී සිටී. අනන්‍යතාවය නැති වූ විටෙක අවශ්‍ය ඕනෑම අවස්ථාවක නම, ජාතිය හා පවුල් සබඳතා ඉදිරිපත් කර එය යළිත් ස්ථාපනය කිරීමට රජය බැඳී සිටී.

### 9. දෙමව්පියන්ගෙන් වෙන්වීම
ළමුන්ගේ උපරිම යහපත සඳහා පමණක් (එනම් මව්පියන් විසින් ළමුන්ට අකටයුත්තක් කරනවා නම් හෝ නොසළකා හරිනවා නම්) මිස ඔවුන් දෙමාපියන්ගෙන් වෙන් නොකල යුතු ය. දෙමව්පියන් වෙන්ව ජීවත් වීමට තීරණය කළහොත් ළමයාට ඔවුන්ගෙන් එක් අයකු සමග ජීවත් වීමට සිදුවනු ඇත. එහෙත් මව සහ පියා සමග පහසුවෙන් සම්බන්ධතා පවත්වාගෙන යාමට ළමයාට අයිතියක් ඇත.

### 10. පවුලක් ලෙස නැවත එක්වීම
ඕනෑම රටකින් පිටවීමටත්, තම පවුල සමග නැවත එක්වීමටත්, තම රටට නැවත පැමිණීමටත් ළමයාට හා දෙමව්පියන් හට අයිතියක් ඇත.

### 11. ළමුන් පැහැරගෙන යාම
දෙමව්පියන් හෝ තුන්වන පාර්ශවයක් විසින් ළමයින් පැහැරගෙන යාම හෝ බලහත්කාරයෙන් රඳවා තැබීම වැළැක්වීම හා ළමයා නැවත ලබාගැනීමට කටයුතු කිරීම රජයේ වගකීම යි.

### 12. ළමයාගේ මතය
කිනම් ආකාරයකින් හෝ ළමයා කෙරෙහි බලපාන තීරණයක් දෙමව්පියන් හෝ වැඩිහිටියන් විසින් ගනු ලබනවිට දී තම මතය ප්‍රකාශ කිරීමට ළමයාට අයිතියක් ඇති අතර, එම මතය සැළකිල්ලට ගත යුතු ය.

### 13. නිදහස් ලෙස අදහස් ප්‍රකාශ කිරීම
යම් යම් තොරතුරු සොයාගෙන එවා පිළිබඳව තමන් සිතන දේ කීමට ළමයාට අයිතියක් ඇත. අන් අයගේ අයිතීන්ට හානියක් නොවන ලෙස ඒ අදහස් ප්‍රකාශ කිරීමට ද ළමයාට අයිතියක් තිබේ.





### 14. නිදහසේ සිතීම හා ආගමක් ඇදහීම
තමන්ට රිසි සේ සිතීමට හා ආගමක් ඇදහීමට ළමුන්ට අයිතියක් ඇත. මෙහි දී දෙමව්පිය මාර්ගෝපදේශකත්වය ලබා ගත යුතු අතර, රටේ පවතින නීතියට අනුකූලව මෙම නිදහස භුක්ති විදිය යුතු ය.

### 15. ඇසුරුකිරීමේ නිදහස
අනෙක් ළමයින් හමුවී යාහළු මිත්‍රකම් ඇති කර ගැනීමට අයිතියක් ඇත. අනුන්ගේ අයිතීන්ට බාධා නොවන අයුරින් සමිති සමාගම් පිහිටුවා ගැනීමට ද ඔවුන්ට අයිතියක් ඇත.

### 16. පෞද්ගලිකත්වය රැකගැනීම
සෑම ළමයෙකුට ම පෞද්ගලික ජීවිතයකට අයිතියක් ඇත. තම පෞද්ගලිකත්වය, පවුල, නිවෙස හා ලිපි ගනුදෙනු සම්බන්ධව අන් අයගේ මැදිහත්වීමෙන් තොරව කටයුතු කිරීමට ඔවුන්ට අයිතියක් ඇත.

### 17. නිසි තොරතුරු ලබාගැනීම
දේශීය හා විදේශීය ය තොරතුරු මූලාශ්‍රයන්ගෙන් තොරතුරු ලබාගැනීමට ළමුන්ට ඉඩ සළසා දීම රජයේ වගකීම යි. මෙහි දී ඔවුන්ගේ ශුභ සිද්ධියට හේතුවන හා ඔවුන්ගේ සංස්කෘතික අගයන්ට හානි නොවන තොරතුරු ළමුන් වෙත ලබාදීමට වග බලා ගතු යුතු ය.

### 18. දෙමව්පිය වගකීම
මව්පියන් දෙදෙනාම ළමයාගේ වැඩීම හා වර්ධනය පිළිබඳ සමසේ වගකීම දැරිය යුතු ය. ඔවුන් හැමවිට ළමයාගේ යහපත උදෙසා ක්‍රියා කළ යුතු අතර, මේ සඳහා රජය ඔවුන්ට සහය විය යුතු ය.

### 19. අපයෝජනයෙන් හා නොසලකා හැරීමෙන් ආරක්ෂා වීම
අපයෝජනයෙන් හා නොසලකා හැරීමෙන් ආරක්ෂා වීමට ළමුන්ට අයිතියක් ඇත. දෙමාපියන්ට හා රැකබලාගන්නන්ට ළමුන්ට හිංසා කිරීමට කිසිම අයිතියක් නැත. අපයෝජනයට ලක්වීමෙන් ළමුන් ආරක්ෂා කරගැනීමත්, එසේ අපයෝජනයට ලක්වූ දරුවන් පුනරුත්ථාපනය කිරීමත් රජයේ වගකීම යි.

### 20. පවුලක් නොමැති දරුවන්ට රැකවරණය
ළමයකු දරුකමට හදගන්නේ නම් එය නීත්‍යානුකූලව හා ළමයාග් උපරිම යහපතට හේතුවන ලෙස සිදු කළ යුතු ය.

### 21. දරුකමට හදගැනීම
ළමයෙකු දරුකමට හදගන්නේ නම් එය නීත්‍යානුකූලව හා ළමයාගේ උපරිම යහපතට හේතුවන ලෙස සිදු කළ යුතු ය.

### 22. සරණාගත ළමයි.
ආරක්ෂාව පතා ළමයෙකුට තම නිවස හෝ රට අතහැර යාමට සිදුවේ නම්, එවන් සරණාගත ළමුන්ට විශේෂ ආරක්ෂාව ලැබීමට අයිතියක් ඇත.



ළමුන් මෙන් හැදෙන්නට හා වැඩෙන්නට ද, විශේෂ රැකවරණයක් හා අධ්‍යාපනයක් ලබාගැනීමට ද, හැකිතාක් දුරට ස්වාධීන වීමටත්, ක්‍රියාශීලී, පූර්ණ ජීවිතයක් ගත කිරීමටත් අයිතියක් ඇත.

### 24. සෞඛ්‍යය හා සෞඛ්‍ය සේවා
මනා සෞඛ්‍යයකින් යුක්ත වීමටම ළමයාට අයිතියක් ඇත සෞඛ්‍ය සේවාවන් ලැබීමටත්, මහජන සෞඛ්‍යය පිළිබඳ අධ්‍යාපනය ලැබීමටත්, ළමුන්ට අයිතියක් ඇත.

### 25. ආයතනගත කර ඇති ළමුන් පිළිබඳ අධීක්ෂණය
ළමයාගේ රැකවරණය, ආරක්ෂාව හා ප්‍රතිකාර සඳහා ඔහු/ඇය යම් ස්ථානයක රඳවා තිබේ නම්, අදාළ ස්ථානය පිළිබඳව හා ළමයා පිළිබඳව නිරන්තරව අධීක්ෂණය කළ යුතු ය.

### 26. සමාජ ආරක්ෂාව
තම රටේ පවතින සමාජ ආරක්ෂණ වැඩසටහන්වලින් ප්‍රයෝජන ලැබීමට ළමයාට අයිතියක් ඇත.

### 27. ජීවන තත්ත්වය
මනා ජීවන තත්වයකට හිමිකම් කීමට අයිතියක් සෑම ළමයෙකුටම ඇත. ළමයාට ඇති ඇඳුම් පැළඳුම් හා වාසය කිරීමට ස්ථානයක් ලබාදීම දෙමව්පියන්ගේ වගකීම යි. දෙමව්පියන්ට මෙය කිරීමට අපහසු අවස්ථාවන්හි දී රජය ඊට මැදිහත් විය යුතු ය.

### 28. අධ්‍යාපනය
අධ්‍යාපනය ලැබීමට සියලුම ළමයින්හට අයිතියක් ඇත. අඩුම තරමේ මූලික අධ්‍යාපනය අනිවාර්ය කිරීමටත්, එය නොමිලයේ ලබාදීමට කටයුතු කිරීමත් රජයේ වගකීම යි.



## 29. අධ්‍යාපනයේ අරමුණු

අධ්‍යාපනයේ පරමාර්ථය වනුයේ ළමයාගේ පෞරුෂත්වය, කුසලතා සහ මානසික ශාරීරික හාකියාවන් පරිපූර්ණ ලෙස වර්ධනය කිරීම යි. වගකීමෙන්, සාමකාමීව නිදහස් සමාජයක ජීවත්වීමට ද අනිත් පුද්ගලයන්ගේ අයිතිවාසිකම් වටහාගෙන, පරිසරයට ගරු කරමින් ජීවත් වීමට ද අධ්‍යාපනය තුළින් ළමුන් සූදනම් කළ යුතු ය.

## 30. සුළු ජන කොටස්වලට අයත් ළමුන්

සුළු ජන කණ්ඩයමකට අයත් ළමයින්ට තම සංස්කෘතිය භුක්ති විඳීමටත් තම ආගම ඇදහීමටත් තම භාෂාව භාවිතා කිරීමටත් අයිතියක් ඇත.

## 31. ක්‍රීඩා, විනෝදාත්මක හා සංස්කෘතික කටයුතු

ක්‍රීඩා කිරීමට, විනෝදයෙන් සිටීමට, සංස්කෘතික හා සෞන්දර්යාත්මක ක්‍රියාකාරකම්හි යෙදීමට ද ළමුන්ට අයිතියක් ඇත.

## 32. ළමා ශ්‍රමය

තම අධ්‍යාපනයට, සෞඛ්‍යයට හෝ වර්ධනයට හානියක් වන රැකියාවලින් හෝ තත්ත්වයන්ගෙන් ආරක්ෂා වීමට ළමුන්ට අයිතියක් ඇත. රැකියාවක නිරතවීමට අදල අවම වයස් මට්ට ම රජය විසින් තීරණය කළ යුතු යි. එමෙන්ම එම ළමුන් සඳහා යහපත් සේවා තත්ත්වයන් ද ඇති කළ යුතු යි.

## 33. මත්ද්‍රව්‍ය උවදුර

නීත්‍යානුකූල නොවන මත්ද්‍රව්‍ය භාවිතයෙන් හා මත්ද්‍රව්‍ය නිෂ්පදනය හා බෙදහැරීමෙන් වැලකීමට ළමුන්ට අයිතියක් ඇත.

## 34. ලිංගික අපයෝජනය

ලිංගික අපයෝජනයෙන් හා ලිංගික අතවරවලින් ආරක්ෂා වීමටත් ව්‍යාපාරික වශයෙන් කෙරෙන ලිංගික කටයුතුවලින් හා අසභ්‍ය ප්‍රකාශන වැනි දේවලින් ආරක්ෂාවීමටත් ළමයාට අයිතියක් ඇත.

## 35. විකිණීම හා පැහැරගෙන යාම

ළමුන් පැහැරගෙන යාම හා විකිණීම වැළැක්වීමට ගත හැකි සියලුම පියවර රජය විසින් ගත යුතු ය. ළමුන් විකිණීම, ගණිකා වෘත්තියේ යෙදවීම හා අසභ්‍ය ප්‍රකාශනවලට සම්බන්ධ කර ගැනීම පිළිබඳ "අතිරේක සම්මුතියක්" වසර 2000 මැයි මාසයේ දී හඳුනවා දෙන ලදී. එය ක්‍රියාත්මක වීම නිසා වැරදිකරුවන්ට එරෙහිව දැඩි නීති ක්‍රියාත්මක කිරීමටත්, අතවරයට ලක්වූවන්ට වැඩි ආරක්ෂාවත්, මෙවන් වැරදි කරන අයට එරෙහිව කටයුතු කිරීමට රටවල් අතර වඩාත් සමීප සම්බන්ධතා ඇති වීමටත් හේතුවිය.

## 36. වෙනත් ආකරයේ අපයෝජන

32 සිට 35 දක්වා ඇති වගන්තිවලට සඳහන්ව නැති වෙනත් සියලුම ආකාරයේ අපයෝජනවලින් ළමුන් ආරක්ෂා කර ගැනීම රජය සතු වගකීම යි.

## 37. වධ හිංසා කිරීම සහ නිදහස උදුරා ගැනීම

ළමයින්ට වධ හිංසා කිරීම, දරුණු ලෙස සැළකීම හෝ දඬුවම් කිරීම, ජීවිතාන්තය දක්වා සිර දඬුවම් නියම කිරීම හෝ මරණීය දණ්ඩනයට ලක් කිරීම, නීත්‍යානුකූල නොවන ලෙස අත්අඩංගුවට ගැනීම හෝ ඔවුන්ගේ නිදහස උදුරා ගැනීම නොකළ යුතු ය. නීත්‍යානුකූල ලෙස නිදහස සීමා කළ ළමයෙකුට නිසි ලෙස සැළකීම් ලැබීමට අයිතියක් ඇති අතර, රඳවාගෙන ඇති වැඩිහිටියන්ගෙන් වෙන්ව සිටීමට ද තම පවුල සමග සම්බන්ධතා පවත්වාගෙන යාමට ද නීතිමය හෝ වෙනත් ආධාර ලැබීමට ද අයිතියක් ඇත.

## 38. සන්නද්ධ අරගල

යුද්ධමය වාතාවරණයක දී ආරක්ෂාව ලැබීමට ළමයින්ට අයිතියක් ඇත. අවුරුදු 16 ට අඩු කිසිම ළමයකු යුද්ධයට සම්බන්ධ කර ගැනීම හෝ ආරක්ෂක හමුදවන්ට බඳවා ගැනීම නොකළ යුතු ය. යුද්ධයෙන් පීඩාවට ලක් වූ ළමුන්ට රැකවරණය රජය විසින් ලබා දිය යුතු ය.

ළමුන් සන්නද්ධ අරගලවලට සහභාගි කරවාගැනීම පිළිබඳ අතිරේක සම්මුතියක්, වසර 2000 මැයි මස හඳුන්වා දෙන ලදී. එය ක්‍රියාත්මක වීම නිසා ළමුන් සන්නද්ධ අරගලවලට සහභාගි කරවා ගැනීම තහනම් විය. එයින් අදහස් කළේ පුද්ගලයකුට සන්නද්ධ අරගලවලට ඍජුවම සම්බන්ධ වී සටන් කළ හැක්කේ වයස අවුරුදු 18 ඉක්ම වූ පසුව යි.

## 39. පුනරුත්ථාපන රැකවරණය

යුද්ධයෙන් පීඩාවට ලක් වූ ළමුන්, වධ හිංසා වලට ලක්වූ ළමුන්, නොසැළකිල්ලට, අපයෝජනයට හෝ අතවරයට ලක්වූ ළමුන්ට නිසි ප්‍රතිකාර ලබාදීමත්, ඒ තුළින් ඔවුන්ට සාමාන්‍ය ජීවිතයක් ගත කිරීමට හැකියාව ලබාදීමත් රජය විසින් කළ යුතු ය.

## 40. ළමයා සහ නීතිය

ළමයකු අපරාධයක් කිරීම පිළිබඳ චෝදනා ලැබ සිටී නම් නීතිමය හා වෙනත් ආධාර ලැබීමට ඔහුට හෝ ඇයට අයිතියක් ඇත. ළමුන් ආයතනගත කිරීමත්, නඩු විභාගවලට ළමුන් ඉදිරිපත් කිරීමත් හැකි සෑම විටම අවම කළ යුතුම ය.

## 41. පවත්නා ඉහළ තත්වයන් රැකගැනීම

රටේ පවතින නීති, මෙම ප්‍රඥප්තියේ සඳහන් ඒවාට වඩා ඉහළ මට්ටමක පවතී නම් එම ඉහළ මට්ටමේ නීති ළමුන් සඳහා අදළ විය යුතු ය.



## 42. ක්‍රියාත්මක කිරීම

ළමා වැඩිහිටි දෙපිරිසටම මෙම ප්‍රඥප්තිය දැනගැනීමට සැලැස්වීම රජයේ වගකීම යි.

ප්‍රඥප්තියේ වගන්ති 54 ක් ඇත. අනෙක් වගන්තිවලින් කියවෙන්නේ

- සෑම අවුරුදු 5 කට වරක්, ප්‍රඥප්තිය ක්‍රියාත්මක කිරීම පිළිබඳ ප්‍රගතිය රජය විසින් වාර්තා කිරීම හා
- රජයයන් විසින් තමන් මෙම ප්‍රඥප්තියට ඇති බැඳීම කුමන ආකාරයකින් ක්‍රියාත්මක කළ යුතු ද යන්න ය.

එක්සත් ජාතීන්ගේ ළමා අයිතිවාසිකම් පිළිබඳ ප්‍රඥප්තියේ සඳහන් ආකාරයට සියලුම ළමුන්හට පැවැත්මට, සංවර්ධනයට, ආරක්ෂාවට හා සහභාගි වීමට අයිතීන් ඇත.

2001 සැප්තැම්බර් මාසයේ දී ලෝක නායකයින්, තීරණගන්නන් හා ළමා ගැටලු පිළිබඳ විශේෂඥයින් නිව්යෝක් නගරයේ එක්සත් ජාතීන්ගේ මූලස්ථානයේ දී ළමයින් හා ඔවුනට අදල ප්‍රශ්න පිළිබඳව සාකච්ඡා කරන ලදී. එහිදී ළමා අයිතීන් මොනවා ද? ඔවුන්ගේ ගැටලු කවරේ ද යන්න දීර්ඝ ලෙස සාකච්ඡාවට භාජනය විය. එක්සත් ජාතීන්ගේ ළමා ප්‍රඥප්තියට අනුව ළමා අයිතීන් වල පැවැත්ම, වර්ධනය ආරක්ෂාව හා සහභාගිත්වය වැදගත් වේ. අනිකුත් අයිතීන් අතරින් සහභාගිත්වය පිළිබඳ අයිතිය ළමුන්ට ඉතා වැදගත් වේ.

සහභාගිත්වය ලෙස අප හඳුන්වන්නේ ළමුන් හා තරුණ තරුණියන්

- ස්වාධීනව සිතීම.
- තම අදහස් හොඳින් ඉදිරිපත් කර, තම ගැටලුවල දී වැඩිහිටියන් ද සහභාගි කර ගැනීම.
- අනෙක් අය සමග යහපත් ප්‍රතිඵල ලබාගැනීම සඳහා එකතු වී කටයුතු කිරීම.
- තම ජීවිතයට, තම ප්‍රජාවට හා තමා ජීවත් වන සමාජයට බලපාන තීරණ ගැනීමේ දී ඊට සහභාගි වීම හා
- අනෙක් ළමුන්ගේත්, වැඩිහිටියන්ගේත් අදහස්වලට ගරු කිරීම ය.

එක්සත් ජාතීන්ගේ ළමා අරමුදල (යුනිසෙෆ්) ළමුන් වෙනුවෙන්ම ක්‍රියාත්මක වන එක්සත් ජාතීන්ගේ නියෝජිත සංවිධානය යි. යුනිසෙෆ් ක්‍රියාත්මක වන්නේ වෙනත් එක්සත් ජාතීන්ගේ අනුබද්ධ ආයතන, රජයයන්, රාජ්‍ය නොවන සංවිධාන හා සිවිල් සමාජය සමග ළමා අයිතීන් ප්‍රචලිත කිරීමටත් ඒවා රැකගැනීමටත් ය.

මෙම පත්‍රිකාව යුනිසෙෆ් ආයතනය විසින් කළ ප්‍රකාශනය කි. ළමා අයිතීන් පිළිබඳ ප්‍රඥප්තියේ සම්පූර්ණ ලියවිල්ල හෝ වෙනත් තොරතුරු අවශ්‍ය නම් පහත සඳහන් ලිපිනයට ලියන්න.

unicef

5, ගීතාංජලී පෙදෙස, කොළඹ 03, ශ්‍රී ලංකාව.
දුරකථනය : 2555270, ෆැක්ස් : 2551333
ඊමේල් : colombo@unicef.org

GUNARATNE OFFSET LTD

